# ආර්ථික විද්‍යාව
## 2022 SAP
## Online ව්‍යුහගත ප්‍රශ්න පත්‍රය සඳහා උපදෙස් පත්‍රිකාව

01. ප්‍රශ්න පත්‍රය ''අ'' උප කොටස සහ ''ආ'' උප කොටස ලෙස කොටස් දෙකකින් යුක්ත වේ. ''අ'' උප කොටසේ ප්‍රශ්න තුනක් ද, ''ආ'' උප කොටසේ ප්‍රශ්න තුනක් ද බැගින් මුළු ප්‍රශ්න හයකි.

02. පිළිතුරු සැපයීම සඳහා පැය **දෙකයි මිනිත්තු දහයක** කාලයක් ලැබේ. **පළමු මිනිත්තු දහයක** කාලය තුළ ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සපයන ප්‍රශ්න තෝරා ගන්න.

03. ''අ'' උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, ''ආ'' උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන මුළු ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

04. පිළිතුරු සැපයීම සඳහා A4 හෝ Foolscap ප්‍රමාණයේ කඩදාසි කොළ භාවිතා කරන්න. සෑම කොළයක ම හතර පැත්තෙන් ම අඟල් භාගයක මායිම ඉඩ (Margin) තබන්න.

05. පිළිතුරු පත්‍රයේ මුල් **පිටුවේ** පහත සඳහන් දෑ පමණක් ලියා තබන්න.

    (i) විභාගයේ නම
    උදා : 2022 SAP Final I

    (ii) ඔබේ සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකය
    (සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකයක් ලැබී නොමැති විභාග අපේක්ෂකයන් තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කරන්න.)

    (iii) පිළිතුරු ලියන ලද ප්‍රධාන ප්‍රශ්න අංක අනුපිළිවෙළින්
    උදා : 01, 02, 04, 06

    (iv) පිළිතුරු සපයන ලද මුළු පිටු ගණන

06. පිළිතුරු පත්‍රයේ **සෑම පිටුවක ම** පිටු අංකය, සක්‍යා හැඳුනුම්පත් අංකය / ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි ව සටහන් කරන්න.

07. සෑම **ප්‍රධාන** ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

08. පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා පැන්සල් භාවිතා නො කරන්න. පිළිතුරු පත්‍රය තුළ අනවශ්‍ය සටහන් ඇතුළත් නො කරන්න.

09. ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසානයේ දී පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ තොරතුරු පැහැදිලිව පෙනෙන පරිදි සෑම පිටුවක ම ඡායාරූප ගෙන ඔබට දී ඇති link එක වෙත upload කරන්න. සෑම පිටුවක් ම upload කිරීමට වගබලා ගන්න.

10. පිළිතුරු පත්‍රය upload කිරීම සඳහා පැය භාගයක කාලයක් හිමි වේ. තාක්ෂණික දෝෂ හේතුවෙන් එම කාලය තුළ upload කරගත නොහැකි වන විභාග අපේක්ෂකයින් ඔබට ලබා දෙන whatsapp අංකයට පිළිතුරු පත්‍රයේ ඡායාරූප එවන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

# සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2022
# Sakya Advanced Level Preparatory Examination 2022

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

Final I

පැය දෙකයි මිනිත්තු දහය යි
*Two Hours & Ten Minutes*

**උපදෙස් :**

* **පළමු මිනිත්තු දහයක** කාලය තුළ ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සපයන ප්‍රශ්න තෝරා ගන්න.
* "අ" උප කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, "ආ" උප කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

01. (i) "ආවස්ථික පිරිවැය" නිර්වචනය කරන්න. නිෂ්පාදනය හෝ පරිභෝජනයට අදාළව ආවස්ථික පිරිවැයක් හට ගන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
(ii) ව්‍යවසායකත්වය හා මානව ප්‍රාග්ධනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)
(iii) ''නිෂ්පාදන හැකියා වක්‍රය මත කිසියම් ලක්ෂ්‍යයක නිෂ්පාදනය කළ පමණින් ආර්ථික කාර්යක්ෂමතා අරමුණු අත්කර ගත නොහැක.'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iv) අ. නිෂ්පාදන හැකියා වක්‍රයක් දකුණට විතැන් වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 02 යි)
ආ. සම්පත් හිඟකම සංකල්පය නිෂ්පාදන හැකියා වක්‍රයකින් නිරූපණය කරන්නේ කෙසේ ද? (ලකුණු 02 යි)
(v) වෙළෙඳ පොළ ආර්ථික පද්ධතියක හිඟ සම්පත් සලාකනයෙහි ලා, මිල මගින් ඉටු කරන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

02. (i) භාණ්ඩයක සැපයුම් නම්‍යතාව තීරණය කරන සාධක කවරේ දැයි දක්වන්න. (ලකුණු 03 යි)
(ii) "සෑම බාල භාණ්ඩයක් ම ගිෆන් භාණ්ඩයක් වන්නේ නැත." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iii) පහතට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක මධ්‍යය ලක්ෂ්‍යයේ සිට ඉහළට සහ පහළට ගමන් කරන විට පරිභෝජන වියදම හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iv) නිදහස් තරඟකාරී වෙළඳ පොළක අලෙවිවන භාණ්ඩයකට සමතුලිත මිලක් තීරණයවන ආකාරය ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(v) අ. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කිරීමේ ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
ආ. සාමාන්‍ය භාණ්ඩ, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සුඛෝපභෝගී භාණ්ඩ හඳුනා ගැනීමට ආදායම් ඉල්ලුම් නම්‍යතාව යොදා ගන්නා ආකාරය දක්වන්න. (ලකුණු 02 යි)

තුන්වෙනි පිටුව බලන්න

03. (i) බඩ ඉරිඟු වෙළෙඳ පොළ පූර්ණ තරඟකාරී යැයි සලකන්න. බඩ ඉරිඟු වෙළෙඳ පොළට අදාළ පහත විස්තර ඔබට සපයා ඇත.

| බඩ ඉරිඟු කිලෝවක මිල (රු.) | බඩ ඉරිඟු ඉල්ලුම් ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | බඩ ඉරිඟු සැපයුම් ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| 20 | 220 | 100 |
| 40 | 140 | 260 |

අ. බඩ ඉරිඟු සඳහා වන ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත දක්වන්න. (ලකුණු 04 යි)
ආ. බඩ ඉරිඟු කිලෝවක සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02 යි)
ඉ. සමතුලිත මිලේ දී පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(ii) ඉහත බඩ ඉරිඟු කිලෝවක් සඳහා රු. 7.50ක නිෂ්පාදන සහනාධාරයක් ලබා දීමට රජය තීරණය කරයි නම්, පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අ. සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන වියදම. (ලකුණු 02 යි)
ආ. නිෂ්පාදක අතිරික්තයේ වැඩි වීම. (ලකුණු 02 යි)
ඉ. අහිමි වූ ශුභ සාධනය. (ලකුණු 02 යි)

(iii) නිෂ්පාදන සාධකයක් සඳහා වක්‍ර ඉල්ලුමක් පවතින්නේ ඇයි ? නිෂ්පාදන සාධකයක ඉල්ලුම තීරණය කරන සාධක කවරේ ද? (ලකුණු 04 යි)

## "ආ" උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

04. (i) අ. ගිණුම්කරණ පිරිවැය හා ආර්ථික පිරිවැය අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)
ආ. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳුණු උපකල්පන කවරේ ද? (ලකුණු 02 යි)

(ii) කෙටි කාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළක්, ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳ පොළක් සමඟ සැසඳීමේ දී දැකිය හැකි සමානකම් **දෙකක්** හා අසමානකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) පූර්ණ තරඟකාරී ආයතනයක් ප්‍රමාණ අක්ෂයට සමාන්තර පැතලි ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන අතර, එම කර්මාන්තය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) පූර්ණ තරඟකාරී ආයතනයක ක්‍රියාකාරීත්වය පහතින් දැක් වේ.




අ. ප්‍රාමාණික ලාභ උපයනුයේ කවර මිලක දී ද? (ලකුණු 01 යි)
ආ. ව්‍යාපාරය වසා දැමීමට තීරණය කළ යුත්තේ කවර මිලක දී ද? (ලකුණු 01 යි)
ඉ. භාණ්ඩයේ මිල රු. 35.00 දී ආර්ථික ලාභය කොපමණ ද? (ලකුණු 02 යි)

05. (i) රටකට දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීම සඳහා පහත සිදුවීම් යොදා ගත යුතු ද? නැද් ද? යන්න දක්වන්න. ඔබේ පිළිතුරට හේතුව සඳහන් කරන්න.
අ. ආයතනයක් පැරණි මෝටර් රථ දෙකක් ඉතා ඉහළ ලාභයක් සහිතව විකිණීම.
ආ. ආයෝජකයෙකු මිල දී ගෙන තිබූ සමාගම් කොටස් අලෙවි කිරීම .
ඉ. ගෘහණියක් තම රැකියාවෙන් ඉවත් වී දරුවන් රැකබලා ගැනීම.
ඊ. ගෘහණියක් තම නිවසේ පරිභෝජනය සඳහා කාබනික පොහොර භාවිත කරමින් එළවළු වගා කිරීම.
උ. ලියාපදිංචි නොවූ මූල්‍ය ආයතනයක්, වෙළෙඳුන්ට ණයට මුදල් ලබා දී පොලියක් උපයා ගැනීම. (ලකුණු 05 යි)

(ii) ශුද්ධ ජාතික ආදායම දී ඇති විට පහත සංකල්ප ලබා ගැනීමට කළ යුතු ගැලපීම් කවරේ දැයි දක්වන්න.
අ. පෞද්ගලික ආදායම
ආ. වැය කළ හැකි පෞද්ගලික ආදායම
ඉ. වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 03 යි)

(iii) කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළව පහත විස්තර සපයා ඇත. (සියලු ම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි.)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 600 |
| රජයේ මිල දී ගැනීම් | 200 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | -50 |
| ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය | -100 |
| දළ ආයෝජනය | 400 |
| භාණ්ඩ හා සේවා අපනයන | 200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 80 |
| භාණ්ඩ හා සේවා ආනයන | 500 |

පහත දෑ ගණනය කරන්න.
අ. වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02 යි)
ආ. දළ ජාතික ආදායම (ලකුණු 02 යි)
ඉ. ජාතික ඉතුරුම් අනුපාතිකය (ලකුණු 02 යි)
ඊ. මුළු සම්පත් (ලකුණු 02 යි)

(iv) ජාතික ගිණුම් සම්පාදනයේ දී දක්නට ලැබෙන සීමාවන් කවරේ ද? (ලකුණු 04 යි)

06. (i) චක්‍රීය ආදායම් ප්‍රවාහයේ "විදීම්" යන්නෙන් කවරක් අදහස් වේ ද? විවෘත ආර්ථිකයක දක්නට ලැබෙන විදීම් කවරේ ද? (ලකුණු 04 යි)

(ii) ''ආර්ථිකයක සමාහාර වියදමට සරිලන නිමැවුම් මට්ටමක් පවත්වා ගැනීම (Y = E), සමතුලිත ආදායම් මට්ටමක් තීරණය වීම සඳහා අත්‍යාවශ්‍ය වේ.'' පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) රාජ්‍ය කටයුතු හා විදේශ වෙළෙඳාමක් නොමැති ආර්ථිකයක පහත විස්තර සපයා ඇත.

| ආදායම (රු. බි.) | පරිභෝජන වියදම (රු. බි.) | ආයෝජන වියදම (රු. බි.) |
|---|---|---|
| 400 | 400 | 150 |
| 800 | 700 | 150 |

අ. සරල රේඛාවක් යැයි උපකල්පනය කරමින් පරිභෝජන ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 02 යි)
ආ. පරිභෝජන වක්‍රය හා ආයෝජන වක්‍රය එක ම ප්‍රස්තාර සටහනක දක්වන්න. (ලකුණු 02 යි)
ඉ. ඉහත ප්‍රස්තාර සටහනේ ම $45^0$ රේඛාව හා සමාහාර වියදම් වක්‍රය ද අඳින්න. (ලකුණු 02 යි)
ඊ. සමතුලිත ජාතික ආදායම, විදීම් - කාන්දුවීම් ප්‍රවේශය යටතේ සමීකරණ විසඳා ගණනය කරන්න. (ලකුණු 02 යි)

(iv) "විවෘත ආර්ථිකයක් සමතුලිත වීම යනු, අපනයන වලට සමාන ආනයන ප්‍රවාහයක් පවත්වා ගැනීම වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 04 යි)

සැකසුම ඃ බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp